# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1983/39 – 2016 සැප්තැම්බර් 09 වැනි සිකුරාදා – 2016.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සේනක මෛත්‍රී ද ලිවේරා මයා, අංක 639/6, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ, කෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්, අංක 223, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/15/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සේනක මෛත්‍රී ද ලිවේරා මයා, අංක 639/6, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ, කෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ්, අංක 223, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

කොළඹ 08, මොඩ්ල් ෆාම් පාරේ, අංක 223 දරන ස්ථානයේ පිහිටි රෝයල් කලම්බු ගොල්ෆ් ක්ලබ් විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ආහාරපාන) ලෙස සේවයේ යොදවන ලද සේනක මෛත්‍රී ද ලිවේරා නමැති සේවකයා වෙනුවෙන් 2008 වර්ෂයේ අනෙකුත් සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනාව ලබා නොදීම හා 2009 වර්ෂයේ ජනවාරි මස සිට අනිකුත් සේවකයින්ට මෙන් වැටුප් වැඩි කිරීමක් ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලබා දිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 929

---

මගේ අංකය: IR/22/29/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ටී. එම්. නන්දසෝම මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී - කලාපය, වැලිකන්ද.
2. එච්. පී. කේ. යූ. පතිරත්න මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී - කලාපය, සිංහපුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මේල්පිටිය, අංක 75 හි, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/29/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ටී. එම්. නන්දසෝම මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී - කලාපය, වැලිකන්ද.
2. එච්. පී. කේ. යූ. පතිරත්න මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී - කලාපය, සිංහපුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බී කලාපයට අනුයුක්තව කාර්යාල කාර්ය සහායක ලෙස සේවය කරන ටී. එම්. නන්දසෝම මයා සහ එච්. පී. කේ. යූ. පතිරත්න මයා යන කණිෂ්ඨ සේවකයන් යතුරු ලේඛක තනතුර සඳහා පත් කිරීමට 1991 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණයෙන් සමත්ව තිබියදී, එම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න සහ එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 930

---

මගේ අංකය: IR/COM/04/V/2015/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 100/8, ධර්මරාජ මාවත, මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක 114/1 හි, පී. දනන්සූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/V/2015/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 100/8, ධර්මරාජ මාවත, මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ යටිනුවර ඩිපෝවේ සේවය කරන ආර්. යූ. එම්. එස්. රාජකරුණා මහතාට මහනුවර බස් කම්පැනි ලිමිටඩ් හි සේවක මණ්ඩල කළමනාකරුගේ අංක මබස/සේමකො/පා/01/2004 හා 2004.01.29 දිනැති ලිපිය මගින් ලබා දී තිබූ වැටුප් වර්ධක මහනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමනාකාරගේ අංක මබස/සේමකො/පා/04/2004 හා 2004.06.21 දිනැති ලිපිය මගින් අත්හිටුවීම යුක්ති සහගතද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 931

---

මගේ අංකය: IR/COM/04/E/2015/129.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.04.07 වැනි දින අංක 1961/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.04.05 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. ඩී. සුනිල් දයාරත්න මයා, අංක 53/121, කීනගහලන්ද වත්ත, කලගෙඩිහේන.
02. කේ. ඩී. එල්. ජගත් කමල්පෙම් මයා, අංක 8/1 බී, නායක පාර, කටුනායක.
03. ඩබ්. එන්. පී. ප්‍රනාන්දු මයා, අංක 36, ශ්‍රී සුමංගල පාර දකුණ, කළුතර උතුර.
04. ඩබ්. ඒ. ඒ. ඩොනල් රාජ් කුමාර් මයා, පන්සල පාර, මාහේන, වරකාපොල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර පවත්නා 2016.02.18 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් උපාලි සමරවීර මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.04.05 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

09 – 932/1

---

මගේ අංකය: IR/COM/04/E/2015/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. ඩී. සුනිල් දයාරත්න මයා, අංක 53/121, කීනගහලන්ද වත්ත, කලගෙඩිහේන.
02. කේ. ඩී. එල්. ජගත් කමල්පෙම් මයා, අංක 8/1 බී, නායක පාර, කටුනායක.
03. ඩබ්. එන්. පී. ප්‍රනාන්දු මයා, අංක 36, ශ්‍රී සුමංගල පාර දකුණ, කළුතර උතුර.
04. ඩබ්. ඒ. ඒ. ඩොනල් රාජ් කුමාර් මයා, පන්සල පාර, මාහේන, වරකාපොල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 28 හි, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/E/2015/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී. ඩී. සුනිල් දයාරත්න මයා, අංක 53/121, කීනගහලන්ද වත්ත, කලගෙඩිහේන.
02. කේ. ඩී. එල්. ජගත් කමල්පෙම් මයා, අංක 8/1 බී, නායක පාර, කටුනායක.
03. ඩබ්. එන්. පී. ප්‍රනාන්දු මයා, අංක 36, ශ්‍රී සුමංගල පාර දකුණ, කළුතර උතුර.
04. ඩබ්. ඒ. ඒ. ඩොනල් රාජ් කුමාර් මයා, පන්සල පාර, මාහේන, වරකාපොල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් ආයතනයේ සේවය කළ ටී. ඩී. සුනිල් දයාරත්න මහතා, කේ. ඩී. එල්. ජගත් කමල්පෙම් මහතා, ඩබ්. එන්. පී. ප්‍රනාන්දු මහතා සහ ඩබ්. ඒ. ඒ. ඩොනල් රාජ් කුමාර් මහතා යන සේවකයින්ට 2014.11.28 දින අත්සන් තබන ලද සාමූහික ගිවිසුම 2013.04.01 දිනට පෙරදාතම් කර ක්‍රියාත්මක කිරීමේ දී 2013.04.01 දින සිට ඉහත එක් එක් සේවකයා විශ්‍රාම ලැබූ දිනය දක්වා ප්‍රසාද දීමනා, වැටුප් වැඩිවීම් සහ හිඟ පාරිතෝෂික මුදල් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔවුන් එකිනෙකාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 932/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.